14 වන පිටෙන්

බොහෝ අය කීවේ මෙය පෙර ආත්ම භාවයන්හි මතකයන් ඉස්මතු වීමක් බවයි. මෙහි මුල් කතාව අධ්‍යයනයේදී හඳුනා ගත් කරුණු වන්නේ ඉතා කුඩා කාලයේ සිටම මේ දරුවා රූපවාහිනිය නැරඹූ බවත් ඉන් කර්මාන්තශාලාවල කාර් දුම්රිය එන්ජින් ආදිය නිෂ්පාදනය කරන අයුරු නැරඹීමටත්, සංයුක්ත තැටි මගින් ඒවා යළි යළිත් නැරඹීමටත් සෙතිඳු නමැති දරුවාට උවමනා වූ බවය. මෙය එක් එක් අයගේ විෂමතාවයයි. අයෙක් සතුන්ගේ ක්‍රියාකාරකම් ද අයෙක් සටන් ජවනිකා ද අයෙක් ඩයිනෝසරයන් සහිත වැඩසටහන් ද බැලීමට ආශා කරති.

තව ද පුද්ගලයන් අතර අති විශේෂ කුසලතා ඇති අය ද සිටින බව දත යුතුය. විනාඩි තුනකින් තනි අතින් හා දෙකකුලෙන් රූබික් කැට දෙකක් සැකසීමට දක්ෂ දරුවෙක් පසුගිය රූපවාහිනි වැඩසටහනකින් දකින්නට ලැබිණ. පහ වසර දක්වා පමණක් ඉගෙන ගත් වැඩිහිටි ගැමියෙක් ඕනෑම අංකයක් ඕනෑම අංකයකින් ගණක යන්ත්‍රයකට වඩා වැඩි වේගයකින් වැඩි කරන බෙදන අයුරු පැරණි ජාතික රූපවාහිනි වැඩසටහනකින් දක්නට ලැබිණි. තවද ඔහුට ඕනෑම අවුරුද්දක ඕනෑම දිනයක් සඳුදා අඟහරුවාදා ආදී වශයෙන් ක්ෂණිකව කීමේ හැකියාව තිබිණි. මෙම දක්ෂතාවය පාසල් ගුරුවරයකු වූ එම්. ජී. චාර්ලිස් මහතාට ද තිබූ අතර එය ද කලකට පෙර ගුවන්විදුලියෙන් හා රූපවාහිනියෙන් ප්‍රචාරය විය. ජ්‍යොතිෂ ශාස්ත්‍රඥ ඉන්දික තොටවත්ත මහතාට ද කෙනකුගේ කේන්ද්‍රයේ ග්‍රහ පිහිටීම දුන් විට උපන් දිනය හා වේලාව කීමේ හැකියාවක් ඇත. මේවා විශේෂ කුසලතාවයන් ලෙස හැඳින්වේ. සොයා බැලීමේදී කුඩා සෙතිඳුට ද ඇත්තේ ක්ෂණිකව භාෂාවන් හුරු වීමේ ඇති විශේෂ කුසලතාවක් බව පැහැදිලි විය. මහාචාර්ය කාලෝ ෆොන්සේකා මහතාගේ අදහස ද මෙයම විය.

ශාක හෝ සත්වයින්ගේ පරම්පරාවෙන් පරම්පරාවට ආවේණික ගති ලක්ෂණ රැගෙන යන කුඩාම ඒකකය ජානය වශයෙන් හැඳින්වේ. මෙම ජාන පිහිටා ඇත්තේ ඔබ අසා ඇති *DNA* (*Deoxyribo Nucleic Acid&* නමැති න්‍යෂ්ඨික අම්ලය තුළය. මිනිසකු ගත් කල ඔහුගේ උස් මිටි භාවය, ලෙඩ රෝග, කටහඬ දක්ෂතා හමේ වර්ණය ආදී කරුණු බොහොමයක් මෙම ජානය නමැති ඒකකය තුළ ඇත. ඇතැම් විට තමාගේ පියාට නොතිබූ එහෙත් සීයාට හෝ ඉනුත් එහා පරම්පරාවක තිබූ ගති ලක්ෂණ, රෝග, දක්ෂතා ආදිය ජාන තුළින් පුද්ගලයකුට ලැබිය හැකිය. මීට අමතරව පරම්පරාවේ කෙනෙක් දුටු දෙයක් හෝ ඇසුව දෙයක් ජානවල සටහන්ව තිබී එය තමාගේ මතකයක් මෙන් දැනීමට ද හැකියාවක් ඇත. මෙය ඩීජා වූ (*Deja vu*) යනුවෙන් හඳුන්වනු ලැබේ. ප්‍රංශ භාෂාවෙන් මෙහි තේරුම දැකලා පුරුදු යන්නය.

අද යුගයේ නම් මෙය හරි හැටි හිතා ගැනීමට නොහැක්කේ රූපවාහිනි තිරය මගින් බොහෝ ස්ථාන දකින නිසාය. රන්සිරිගේ සිද්ධියේ කරුණු විග්‍රහ කළ විට එය ජානවලින් ගෙනා අතීත මතකයන් විය යුතු යැයි හඳුනා ගැනීමට බොහෝ හේතු ඇත. පුනරුත්පත්තිය පිළිබඳ පර්යේෂණයන් රාශියක් කළ ඉයන් ස්ටීවන්සන් වෛද්‍යවරයාගේ කෘතිවල ඇතැම් අවස්ථාවල පුනරුත්පත්තිය ලැබූ පුද්ගලයා ඉපදී ඇති විට කලින් ආත්මයේ පුද්ගලයා ද ජීවත් වෙමින් සිට ඇත. මෙය වෛද්‍ය ඉයන් මහතා පෙන්වා දෙන්නේ කලින් ආත්මයේ පුද්ගලයා මළ පසු යළි ඉපිද ඇති පුද්ගලයාට ආරූඪ වී ඇති බවය. එහෙත් මෙවන් අවස්ථාවක වඩාත් නිවැරදි පැහැදිලි කිරීම වන්නේ එය පුනරුත්පත්ති මතකයක් නොව ජාන සම්බන්ධතාවකින් ආ මතකයක් බව තහවුරු කර ගැනීමය.

භාග්‍යාගේ සිද්ධියේ සියලූම කාරණා ගැළපෙන අන්දම බැලූ විට එය පැහැදිලිවම පුනරුත්පත්තියක් බව කිව හැක. චම්පිකා මියගිය හා භාග්‍යා ඉපදුන කාල වකවානු නිවැරදිව ගැළපුණු අතර චම්පිකා හා චින්තා පමණක්ම දැනගෙන තිබුණ යම් යම් සිද්ධි භාග්‍යාගෙන් හෙළිදරව් වීම ද පවුල් දෙකේම අයට ඉන් ලාභ ප්‍රයෝජනයක් ගැනීමට අවශ්‍යතාවක් නොතිබීම ද මෙහිලා සැලකිල්ලට ගත යුතු වේ.

ඉහත සඳහන් අවස්ථා සියල්ලටම බොහෝ අය පුනරුත්පත්තියක් ලෙස අර්ථකථනය කිරීමට යෑමෙන් පසුව ඇති වන යම් යම් නොගැලපීම් හේතුවෙන් අපහසුතාවලට පත් වූ අවස්ථා බොහෝය. පුනරුත්පත්තිය යනු බොරුවක් යැයි කීමට මෙම නොගැලපීම් හේතු විය. නැවත ඉපදීමක් ලෙස පෙන්නුම් කරන මෙම අවස්ථා තුනම සමාජයේ විටින් විට දක්නට ලැබෙන බව කල්පනා කිරීම වැදගත්ය.

මේ ලිපියේ දත්ත සඳහා එක් එක් වකවානුවල සහාය වූ අභාවප්‍රාප්ත යටියන පුෂ්පකුමාර ගුරුතුමා, වික්‍රමසිංහ ගුරුතුමා හා රන්සිරි අබේරත්න සොයුරා සංවේග යෙන් සිහිපත් කරන අතර මහනුවර මහ රෝහලේ ශල්‍ය වෛද්‍ය ජයධම්මික ඒකනායක, පුස්සැල්ලාව රෝහලේ වෛද්‍ය දිමුතු රුවන්, කර්මාන්ත අධ්‍යක්ෂ නාමල් ප්‍රසන්න වන්නිආරච්චි, පරිගණක ඉංජිනේරු ජයංග කෞශල්‍ය යන මහත්වරුන්ට ද භාග්‍යා නැගණියට ද ස්තුතිවන්ත වෙමි.







සිංහල ගීතිකා, දේශනා සහ ළමා වැඩසටහන් ඇතුළත්
දේව මෙහෙය සෑම ඉරු දිනකම සවස 5.00 ට

Address: Aspire church, 37b, Fordholm Road,
Hampton Park, 3976

විමසීම් : උදිත : 0403 236 078
Aspire church – Sinhala service